සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ක්‍රිස්තියානි ධර්මය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "බලන්න, කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයකු බිහි කරන්නී ය." යන දිව්‍ය වැකිය ප්‍රකාශ කරන ලද දිවැසිවරයා කවුද?

(1) යෙසායා (2) මීකා (3) ජෙරමියා (4) එසකියෙල්

**2.** දාවිත්ගේ පෙළපතට අයත් වූ බව පැවසෙන්නේ කවුරුන් ද?

(1) ජෝසප් (2) සීමොන් (3) මතෙව් (4) පාවුල්

**3.** ගාබ්‍රියෙල් දේවදූතයාගේ පණිවිඩය සැක කරනු ලැබුවේ,

(1) ජෝසප් ය. (2) සෙකරියස් ය. (3) සිමියොන් ය. (4) එඬේරවරුන් ය.

**4.** ජේසුස් වහන්සේ බැහැදැකීමට පැමිණි ශාස්ත්‍රවන්තයින් විසින් පුදන ලද දේවල් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) රිදී, තුවරලා සහ ගන්ධ රස (2) රිදී, තුවරලා සහ රන්
(3) තුවරලා, ගන්ධ රස සහ සඳුන් (4) තුවරලා, ගන්ධ රස සහ රන්

**5.** ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වූයේ,

(1) ජෙරුසලමයි. (2) සමාරියයි. (3) බෙත්ලෙහෙමයි. (4) නාසරෙත් නුවරයි.

**6.** ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව තේරුම්ගැනීමට ඉදිරිපත් කළ උපමා කතාව වන්නේ,

(1) අබ ඇටය පිළිබඳ උපමා කතාවයි.
(2) වපුරන්නා පිළිබඳ උපමා කතාවයි.
(3) මිදි වත්ත හා ගොවීන් පිළිබඳ උපමා කතාවයි.
(4) අකීකරු පුත්‍රයා පිළිබඳ උපමා කතාවයි.

**7.** "ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරි බලයෙන් ද නොහොත් මේ අධිකාරි බලය ඔබට පැවරුවේ කවරෙක් ද?" යන ප්‍රශ්නය ජේසුස් වහන්සේගෙන් අසන ලද්දේ කුමන අවස්ථාවේ දී ද?

(1) ලෙවී කැඳවනු ලැබූ අවස්ථාවේ දී
(2) අංශභාගි රෝගියා සුව කළ අවස්ථාවේ දී
(3) ජෙරුසලම් දේව මාලිගාව පවිත්‍ර කළ අවස්ථාවේ දී
(4) උපවාසය පිළිබඳ ප්‍රශ්න කළ අවස්ථාවේ දී

[දෙවැනි පිටුව බලන්න.

**8.** තම බලාපොරොත්තු ඉවත දමා දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් හා විශ්වාසයෙන් වෙහෙස වී ක්‍රියා කළ දෙදෙනකු ඇතුළත් වරණය කුමක් ද?
(1) ආබ්‍රහම් සහ ලොත් (2) ආබ්‍රහම් සහ සාරා
(3) ලොත් සහ මෝසෙස් (4) ආබ්‍රහම් සහ මෝසෙස්

**9.** පහත සඳහන් ලක්ෂණ සලකන්න.
A - තමා වෙත පැමිණෙන්නවුන්ට පමණක් සේවය සැලසීම
B - තම ශ්‍රාවකයන්ගේ පාද සේදීම
C - ලෞකික ලාභ ප්‍රයෝජන උදෙසා අන් අය කෙරෙහි බලපෑම් කිරීම
D - කුඩා දරුවන් සේ නිහතමානී වීම

ඉහත ලක්ෂණ අතුරෙන් ජේසුස් වහන්සේ තුළින් දර්ශනය වූ සේවක නායකත්වයේ ලක්ෂණ යුගලය අඩංගු වරණය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**10.** තුන්වන ධර්මදූත ගමනෙන් පසු පාවුල්තුමාව අත්අඩංගුවට පත්වූයේ කුමන ස්ථානයේ දී ද?
(1) සල්මොන් තුඩුවේ දී (2) ලිසියාවේ මුරා නුවර දී
(3) සයිප්‍රසයේ වෙරළාසන්නයේ දී (4) ජෙරුසලම් දේව මාලිගයේ දී

**11.** ජේසුස් වහන්සේ ලාදුරු රෝගියාට අත තබා සුවකිරීම මගින් වත්මන් සමාජයට උගත හැකි පාඩම වන්නේ,
(1) විවිධ රෝග සහිත පුද්ගලයින් සොයා ලියාපදිංචි කළ යුතු බවයි.
(2) විවිධ රෝග සහිත පුද්ගලයින් සමාජගත වීම වැළැක්විය යුතු බවයි.
(3) ඒඩ්ස් රෝගීන් හා මානසික රෝගීන් වැනි අය කොන් නොකර සැලකිය යුතු බවයි.
(4) රෝගීන්ට ඇප උපස්ථාන කිරීමට පවුලේ අය හා මිතුරන් පමණක් සම්බන්ධ විය යුතු බවයි.

**12.** පහත සඳහන් කණ්ඩායම් සලකන්න.
A - වහලුන් B - කාන්තාවන්
C - සද්දුසිවරුන් D - පරිසිවරුන්

ඉහත කණ්ඩායම් අතුරෙන් ජුදා සමාජය තුළ නිසි තැන **නොලද** කණ්ඩායම් යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**13.** සාතන්ට බිඳ දැමීමට **නොහැකි** වූයේ කවුරුන්ගේ ඇදහිල්ල ද?
(1) ජෝබ්ගේ (2) සලමොන් රජුගේ (3) දාවිත්ගේ (4) සාවුල් රජුගේ

**14.** විජාතීන්ට ශුද්ධාත්ම බලය පහළ වූ ස්ථානයක් වන්නේ,
(1) පේදුරුගේ නිවහනයි. (2) අපොලොස්ගේ නිවහනයි.
(3) තිමෝතියස්ගේ නිවහනයි. (4) කොර්නේලියස්ගේ නිවහනයි.

**15.** පෙන්තකොස්ත දිනය සිහිකරනුයේ ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් දින කීයකට පසුව ද?
(1) දින 07 කට පසුව (2) දින 10 කට පසුව
(3) දින 40 කට පසුව (4) දින 50 කට පසුව

**16.** ජුදා සෙනඟ බැබිලෝනියට ගෙන යන බවට අනාවැකි පැවසූ දිවැසිවරයා වන්නේ,
(1) එසකියෙල් ය. (2) ජෙරමියා ය. (3) දානියෙල් ය. (4) ආමෝස් ය.

**17.** එතියෝපීය නපුංසකයාට ශුද්ධ ලියවිලි පහදා දුන් ශ්‍රාවකයා වන්නේ,
(1) අන්ද්‍රෑ ය. (2) තෝමස් ය. (3) සීමොන් ය. (4) පිලිප් ය.

**18.** පහත සඳහන් චෝදනා සලකන්න.
A - ඔහු තමන් ක්‍රිස්තුවරයාණෝ බව ප්‍රකාශ කිරීම
B - ඔහු තමා ක්‍රිස්තුස් නම් රජකු බව ප්‍රකාශ කිරීම
C - ඔහු ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම
D - ඔහු තමන් දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කිරීම

ඉහත චෝදනා අතුරෙන් ජේසුස් වහන්සේට විරුද්ධව පිලාත් ආණ්ඩුකාරවරයා ඉදිරියේ සිදු කරන ලද චෝදනා යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**19.** යුදෙව් යකැදුරන් හා ස්කේවාගේ පුත්‍රයන් සත්දෙනා විසින් ජේසුස් වහන්සේගේ නාමය වැරදි ලෙස භාවිත කළ නිසා ඔවුන්ට සිදු වූ විනාශයෙන් අපට ලැබෙන පණිවිඩය වන්නේ,
(1) නපුර හා අසත්‍යය විනාශ වන බව ය.
(2) අනෙකුත් ආගම් අපට අවභාවිත කළ හැකි බව ය.
(3) යන්ත්‍ර මන්ත්‍ර බලයෙන් ආරක්ෂාව තිබෙන බව ය.
(4) දේව බලය අපට මනා සේ හසුරුවා ගත හැකි බව ය.

**20.** 'ඩුනෝමිස්' යනුවෙන් අදහස් කරනුයේ,
(1) සාමය ය. (2) දේව බල ලකුණු ය.
(3) ආලේපලත් තැනැත්තා ය. (4) ප්‍රාතිහාර්ය හෙවත් හාස්කම් ය.

**21.** "ඔබ පොළොවේ ලුණු ය." ක්‍රිස්තුස් වහන්සේගේ මෙම වදන මගින් ප්‍රකාශ වන්නේ කුමක් ද?
(1) සමාජයට බරක් නොවී සිටීම (2) සමාජය සමෘද්ධිමත් කිරීම
(3) ස්වර්ගයට අඩිතාලමක් දැමීම (4) අන් අයගෙන් ඈත්වීම

**22.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - "තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම"
B - "තමාට ප්‍රේම කිරීම මෙන්ම දේව රාජ්‍යයට ප්‍රේම කිරීම"
C - "තමාගේ මුළු ජීවිතයෙන් ම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම"
D - "තම අසල්වැසියාට මෙන්ම දේව රාජ්‍යයට ප්‍රේම කිරීම"
ඉහත ප්‍රකාශ අතුරෙන් ප්‍රේමය සම්බන්ධ කරමින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ ප්‍රකාශ යුගලය කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

**23.** ජේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් සම්පූර්ණ වූයේ කුමක් ද?
(1) නපුර ජයගැනීමයි
(2) ජේසුස් වහන්සේගේ පරාජයයි
(3) නිහතමානීකම හා යටහත් පහත්කම තාවකාලිකව ජයගැනීමයි
(4) දෙවියන් වහන්සේ හා මිනිසා අතර වන සම්න්ධතාවයට ඇති බාධාව ඉවත් වීමයි

**24.** කිතු උපත පිළිබඳව දේවදූතයන් විසින් එඬේරුන්ට ප්‍රකාශ කිරීමෙන් අදහස් වන්නේ,
(1) එඬේරුන් සමාජයේ විශේෂ ස්ථානයක් ගත් බව ය.
(2) හොඳින් වටහා ගැනීමේ ශක්තියක් ඔවුන් තුළ පැවති බව ය.
(3) ජේසුස් වහන්සේගේ මෙහෙවර දිළින්දන් වැනි අය සඳහා බව ය.
(4) එඬේරුන් පමණක් දෙවියන් වහන්සේගේ විශේෂ සැලකිල්ලට ලක් වූ බව ය.

**25.** ජේසුස් වහන්සේ නිකදේමුස්ට ලබාදුන් පිළිතුර මගින් අනාවරණය වන්නේ කුමක් ද?
(1) අලුත් දිවියකට අභ්‍යන්තර වෙනසක් අවශ්‍ය බව
(2) අන්‍ය ජාතිකයන් සමානව පිළිගැනීම වැදගත් බව
(3) සීමොන් නම් පරිසිවරයාගේ ක්‍රියා කලාපය හෙළා දැක ඇති බව
(4) මාර්තා සහ මරියාගේ ක්‍රියා කලාපය අනුගමනය කළ යුතු බව

**26.** "වගවලසුන් මැදට යවමි." ජේසුස් වහන්සේ පැවසූ මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) සියලුදෙනා ගැන සැකයෙන් බැලිය යුතු බව
(2) අපරාධ ක්‍රියාවල නියැලෙන අය සොයා යා යුතු බව
(3) කාන්තාර මැදින් ගමන් කරන්නට සිදුවන බව
(4) පීඩා හා අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව

**27.** ජාතිවාදය අබිබවා දේව ප්‍රේමය ඉස්මතු වූ කථා වස්තුව වන්නේ,
(1) සාකෙවුස්ගේ කථාව ය. (2) නිකදේමුස්ගේ කථාව ය.
(3) සමාරියේ ස්ත්‍රියගේ කථාව ය. (4) මරියා හා මාර්තාවගේ කථාව ය.

**28.** ක්‍රිස්තුස් වහන්සේ හා අප අතර ඇති ඒකත්වයේ ආදර්ශයට අභියෝගයක් වන අවස්ථාවක් වන්නේ,
(1) විවිධ නිකායන් වශයෙන් බෙදී සිටීම ය.
(2) අන්‍ය ආගම්වලට සහාය වෙමින් කටයුතු කිරීම ය.
(3) කිතුනු එක්සත්කමේ සතිය තුළ එකට යාච්ඤා කිරීම ය.
(4) කිතුනුවන් එකිනෙකාගේ සභාවන් තුළ නමස්කාරයේ යෙදීම ය.

**29.** පහත සඳහන් වැකි සලකන්න.
A - "ඔබ අයකැමියන් ද පව්කාරයන් ද සමග කන්නේ බොන්නේ මන් ද?"
B - "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත"
C - "සබත් දිනයේ දී නොකටයුත්තක් ඔබ කරන්නේ මන් ද?"
D - "මනාලයා මඟුල් ගෙදර සිටිය දී මනාල පිරිසට උපවාසයේ යෙදිය හැකි ද?"
ඉහත වැකි අතුරෙන් ජුදා ආගමික නායකයින් හා ජේසුස් වහන්සේ අතර ඇති වූ සංවාදයේ දී, ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද වැකි යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**30.** පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - ස්වභාව ධර්මය යහපත් ලෙස පවත්වාගෙන යාම අතපසු වීම
B - සංවර්ධන ව්‍යාපෘතීන් නිසි පරිදි ක්‍රියාත්මක කරවීම අතපසු වීම
C - සහනාධාර සේවය නිසි ලෙස පවත්වාගෙන යාම අතපසු වීම
D - සන්නිවේදනය යහපත් ලෙස පවත්වාගෙන යාම අතපසු වීම
ඉහත සඳහන් කරුණු අතුරෙන් ශ්‍රී ලංකාව මෑතක දී මුහුණ දුන් ස්වාභාවික ආපදාවන්ගේ බලපෑම තීව්‍ර වීමට වඩාත් ම හේතු වූ කරුණු යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**31.** පාවුල් හා සීලස් පිලිප්පියේ සිරගෙදර දී ලබාදුන් ආදර්ශය තුළින් කිතුනුවන්ට උගත හැකි පාඩම වන්නේ,
(1) අසාධාරණයන්ට විරුද්ධව නැගී සිටිය යුතු බවයි.
(2) දේව කැමැත්තට ඉඩ දී නිහඬව සිටිය යුතු බවයි.
(3) දුක්විඳීමේ දී පවා සත්‍යගරුකව ක්‍රියා කළ යුතු බවයි.
(4) ලැබෙන අවස්ථාවන් තම යහපත උදෙසා ප්‍රයෝජනයට ගත යුතු බවයි.

**32.** පහත සඳහන් කරුණු සලකන්න.
A - ධනය දෙවියන් වහන්සේගෙන් ලැබුණු ආශිර්වාදයක් බව සභා සාමාජිකයන්ට වටහා ගැනීමට උපකාර කිරීම
B - එකම දෘෂ්ටි කෝණයෙන් බලන අය සභාවට එකතු කර ගැනීම
C - සභාව ව්‍යාප්ත නොවූ පළාත් තුළ ධර්මය ප්‍රචාරය කිරීම
D - යාච්ඤාව, ඉගැන්වීම් හා සාමූහිකත්වය තුළ සභා වර්ධනය කිරීම
ඉහත කරුණු අතුරෙන් වත්මන් කිතුනු සභාවට මුල් කිතුනු සභාවෙන් ලැබෙන සුවිශේෂී මගපෙන්වීම් යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**33.** බහු ජාතික, බහු ආගමික සහ බහු සංස්කෘතික පරිසරයක ජීවත්වන කිතුනුවන්ගේ ජීවන රටාව විය යුත්තේ කුමක් ද?
(1) සියල්ලම නොවැදගත් යැයි සිතා නිහඬව සිටීම
(2) ආධ්‍යාත්මික ජීවිතයට බාධාවන බැවින් අන් අයගෙන් බැහැර වීම
(3) දේව රාජ්‍යයේ වටිනාකම් රැකගෙන අන්‍යයන් සමඟ එකට ජීවත් වීම
(4) දේව රාජ්‍යයේ වටිනාකම්වලට වඩා වැඩි ඉඩක් සමාජීය කටයුතුවලට ලබා දීම

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**34.** ලේ නෑකමට එහා ගිය පවුල් සංකල්පය පිළිබඳ ජේසුතුමාගේ ඉගැන්වීම වන්නේ,
(1) අප ජීවත්වන ප්‍රදේශයේ ජනතාව එකම පවුලකට අයත් බව පිළිගැනීමයි.
(2) සභාව තුළ පවුල් සබඳතාවයන් ශක්තිමත් කර ගත යුතු බවයි.
(3) දේව වචනය අසා එය පිළිපදින අය දේව පවුලට අයත් බවයි.
(4) සභාවේ සාමාජිකත්වය දරන සියලුදෙනාම දේව පවුලට අයත් බවයි.

**35.** ස්නාවක ජොහන් පොදු ජනතාවට කළ ඉගැන්වීම් තුළින් වත්මන් සමාජයට ගත හැකි පණිවිඩය වන්නේ,
(1) සමානත්වය ඇතිව සැම දේ බෙදී යා යුතු බව ය.
(2) දෙවියන් වහන්සේගේ සැපයීම දෙස පමණක් බලා සිටිය යුතු බව ය.
(3) ඇති අය නැති අය කෙරෙහි ආධිපත්‍යය පැතිරවිය යුතු බව ය.
(4) තමා තෘප්තියට පත් වී, අමතර දෑ සතුටින් බෙදාහදා ගත යුතු බව ය.

**36.** ජේසුස් වහන්සේ පරිසිවරුන් හා විනයධරයන් විවේචනය කළ ද ඔවුන් සමග කෑමට වාඩි වූ බව දක්නට ලැබේ. එයින් අපට අදහස් වන්නේ කුමක් ද?
(1) ජේසුස් වහන්සේ ඔවුන්ගේ ක්‍රියා හඳුනා නොගත් බව ය
(2) ජේසුස් වහන්සේ පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප නොකරන බව ය
(3) ජේසුස් වහන්සේ ආගමික නායකයන් සමග සුහදව කටයුතු කළ බව ය
(4) ජේසුස් වහන්සේ ඔවුන් අතර තිබෙන බෙදීම් සමගි කිරීමට උත්සාහ කළ බව ය

**37.** මුල් සභාවේ සහන සේවය සඳහා උපස්ථායකයින් තෝරාගත් ආදර්ශය අනුව වත්මන් සභා මූලිකයින් පත් කළ යුතු වන්නේ කෙසේ ද?
(1) ධනය, බලය හා හැකියා සලකා බැලීමෙනි
(2) තරුණබව සහ ජනප්‍රියත්වය සලකා බැලීමෙනි
(3) මිත්‍රත්වය, පවුල් බලය හා කුලය පදනම් කර ගැනීමෙනි
(4) ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණවීම සලකා බැලීමෙනි

**38.** ඔබගේ දේවස්ථාන ප්‍රදේශය තුළ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් උදෙසා සිදු කිරීමට වඩාත්ම සුදුසු ක්‍රියාව වන්නේ කුමක් ද?
(1) සතිපතා බයිබල් අධ්‍යයන පමණක් පැවැත්වීම
(2) දරිද්‍රතාවය ඇතිවීමට හේතු කාරණා විමසා බැලීම
(3) දේවස්ථාන භූමිය තුළ වගා කිරීමට ඉඩ සලසා උපකාර කිරීම.
(4) දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ට කෙටිකාලීනව වියළි ආහාර සැපයීම

**39.** පහත සඳහන් ගුණාංග සලකන්න.

A - දුක් විඳීම තමාගේ ඉරණම ලෙස පිළිගැනීම
B - මමත්වය නසා පරාර්ථකාමී සේවකත්වයට ඇතුළු වීම
C - දුක් විඳීම හා මරණය කාටත් සිදුවන බව පිළිගැනීම
D - යටහත් පහත්කම, ඉවසීම හා දුක් දැරීම යන චරිත ලක්ෂණවලින් යුක්ත වීම

ඉහත ගුණාංගවලින් 'දුක් විඳින සේවකයාණෝ' ආදර්ශයට ගන්නා කිතුනුවන්ගේ ක්‍රියා කලාපය තුළ දැකිය හැකි ගුණාංග යුගලය කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**40.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් බයිබලයේ සඳහන් 'රන් අණ' තෝරන්න.
(1) "ලෞකික දේ ගැන අනවශ්‍ය ලෙස කරදර වීමෙන් වළකින්න"
(2) "ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම ගැන බලාපොරොත්තු වන්න"
(3) "අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න"
(4) "තළ තළා ඔබගේ ඔඩොක්කුවට මැන දමන්හු ය. සොලව සොලවා දෙනු ලැබේ"

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

15 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I, II |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) "ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දී ය..."

(අ) මෙම ප්‍රකාශය සිදුකළේ කවුරුන් විසින් ද?

(ආ) මෙලෙස පවසන ලද්දේ කාහට ද?

(ii) (අ) ජුදෙව් ජන මතයට අනුව සුබ පණිවිඩය ගෙන එන දූතයාගේ නම කුමක් ද?

(ආ) එවන් අවස්ථාවක් සඳහන් කරන්න.

(iii) ජේසුස් වහන්සේ ජෝර්දාන් ගඟෙහි බෞතීස්මය ලැබූ අවස්ථාවේ ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වීම මගින් වටහාගත හැකි කරුණු **දෙකක්** ලියන්න.

(iv) (අ) "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය" යන්න ප්‍රකාශ කළේ කවුරුන් ද?

(ආ) 'ක්‍රිස්තුවරයාණෝ' (ක්‍රිස්ටොස්) යන්නෙහි අර්ථය ලියන්න.

(v) දෙවියන් වහන්සේ විසින් ඊශ්‍රායෙල් ජනයා හට ලබා දුන් දසපනතෙහි ප්‍රධාන කොටස් **දෙක** ලියා දක්වන්න.

(vi) (අ) දර්ශනවාදය, අධ්‍යාපනය, සාහිත්‍යය, විද්‍යාව සහ කලාව යන සියල්ලට ම ප්‍රසිද්ධ ග්‍රීසියේ නුවර කුමක් ද?

(ආ) දර්ශනවාදය වෙනුවෙන් පෙනී සිටි කණ්ඩායමක් නම් කරන්න.

(vii) (අ) පිලිප්පියේ හිරගෙදර මුලාදෑනියා අසන ලද ප්‍රශ්නය කුමක් ද?

(ආ) එය කාගෙන් අසන ලද්දක් ද?

(viii) දෙවියන් වහන්සේගේ සුවිශුද්ධත්වය ඉදිරියේ දිවැසිවර යෙසායා ප්‍රකාශ කළ තමන්ගේ අඩුපාඩු **දෙකක්** සඳහන් කරන්න.

(ix) (අ) පේදුරුතුමාට තරාතිරම නොබලා මෙහෙවර කිරීමට සිදුවන බව හැඟවූ දර්ශනය දුටුවේ ජොප්පාවේ කාගේ නිවසේ දී ද?

(ආ) එම නිවසේ හිමිකරුගේ රැකියාව කුමක් ද?

(x) (අ) සෑම කෙනෙක්ම අනිවාර්යයෙන්ම අයත් වන ප්‍රාථමික සමාජ ඒකකය කුමක් ද?

(ආ) "ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේමකළාක් මෙන් ප්‍රේම කරන්න" යැයි පාවුල්තුමා පැවසුයේ කා හට ප්‍රේම කරන්න කියා ද?

**2.** (i) ඊශ්‍රායෙල් ජනයා අතර පැවති එඬේර වෘත්තියට අනුව එඬේර කාර්යයන් **දෙකක්** ලියන්න.

(ii) ස්වාමීන් වහන්සේට අයත් බැටළුවන් ලෙස අප ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ කරුණු **තුනක්** ලියන්න.

(iii) ජේසුස් වහන්සේගේ ජීවිතාදර්ශයට අනුව එඬේර කාර්යය ඔබ සමාජය තුළ ඉටු කරන්නේ කෙසේ දැයි කරුණු **පහක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න.

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. (i) වාචික සම්ප්‍රදායට අයත් ආගමික කණ්ඩායම සහ ජුදෙව් ව්‍යවස්ථාව ලිවීමේ හා හැදෑරීමේ අයිතිය ආරක්ෂා කිරීමේ කණ්ඩායම වෙන වෙන ම ලියා දක්වන්න.

(ii) ගතානුගතික අදහස් අනුගමනය කළ සද්දුසිවරුන් තුළ පැවති ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(iii) ජේසුස් වහන්සේ හා වාචික සම්ප්‍රදායට අයත් අය අතර පැවති සංවාදයෙන් කිතුනු ජීවිතයේ යහපැවැත්ම උදෙසා ළඟා කරගත හැකි ගුණාංග **පහක්** දක්වා, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

4. (i) (අ) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය දරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝජනය කළ සාමාජික සංඛ්‍යාව කොපමණ ද?

(ii) (අ) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝජනය කළ කණ්ඩායම් **දෙක** නම් කරන්න.

(ආ) ජේසුස් වහන්සේ පාවාදීමෙන් පසු පළමුවෙන්ම ගෙන යනු ලැබූවේ කුමන ස්ථානයකට ද?

(iii) අසාධාරණය ඉදිරියේ වත්මන් සමාජයේ අප යහපත තෝරාගන්නා අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

5. (i) ජේසුස් වහන්සේගේ මෘත දේහය තැන්පත් කළ සොහොන වෙත, කාන්තාවන් ළඟා වූයේ සතියේ කුමන දවසක ද? රැගෙන ගියේ මොනවාද?

(ii) එම කාන්තාවන් විශ්මයට පත් කරමින් අසන්නට ලැබුණු දේවදූත පණිවුඩ **තුන** ලියන්න.

(iii) ජේසුස් වහන්සේ ජීවමාන බව අත්දකින ඔබ, එය අන් අය හා බෙදා ගන්නා අයුරු කරුණු **පහකින්** කෙටියෙන් විස්තර කරන්න.

6. (i) පාවුල්තුමා සිරකරුවකු ලෙස රෝමය බලා යන ගමනේ දී එතුමා සමඟ එක් වූ **දෙදෙනකු** නම් කරන්න.

(ii) පාවුල්තුමාගේ රෝම ගමන තුළ මුහුණ දුන් අභියෝග **තුනක්** සඳහන් කරන්න.

(iii) පහත සඳහන් එක් එක් ස්ථානවල දී පාවුල්තුමා මුහුණ දුන් අභියෝගයක් බැගින් සඳහන් කොට එම එක් එක් අභියෝගය වර්තමානයේ කිතුනු අපගේ ජීවිතවලට ගළපාගත හැක්කේ කෙසේ දැයි කෙටියෙන් පහදන්න.

(අ) ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී

(ආ) ඇතන්ස්හි දී

(ඉ) ලුස්ත්‍රාවේ දී

(ඊ) එපීසයහි දී

(උ) පර්ගායේ දී

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිතකරන්න.

(i) අභියෝගාත්මක සේවය

– රාජ තේජසින් ගිය ගමන

– ජෙරුසලම ගැන හඬා වැළපීම

– ජෙරුසලම් දේව මාලිගය පවිත්‍ර කිරීමට හේතු කාරණා

– ජෙරුසලම් දේව මාලිගය ගැන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්

– ජෙරුසලම් දේව මාලිගය පවිත්‍ර කිරීමෙන් අපට ගත හැකි පණිවිඩය

(ii) දේව රාජ්‍යය
- දේව රාජ්‍යය යනු
- දේව රාජ්‍යය හා ලෞකික රාජ්‍ය අතර වෙනස
- දේව රාජ්‍යයේ පුරවැසියන්
- දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති
- දේව රාජ්‍යය ගොඩනැගීමට අපගේ දායකත්වය

(iii) ප්‍රතිපත්තිගරුක මිනිසා විනය සම්පන්න වේ.
- ප්‍රතිපත්ති යනු
- දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කිරීමට තුඩු දුන් කරුණු
- දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති පිළිබිඹු වන ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ උපමාවක්
- එමගින් අපට ළඟා කරගත හැකි සත්‍යතාවයන්
- දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති සම්බන්ධව අපට පැවරෙන විශේෂ වගකීම

(iv) බලාපොරොත්තුව
- පුද්ගල ජීවිත තුළ ඇතිවන බලාපොරොත්තු
- දේව කැඳවීමට යටත්ව ගමන් කළ ආදි පියවරු
- බලාපොරොත්තු පිළිබඳ පාවුල්තුමාගේ ඉගැන්වීම්
- ජේසුස් වහන්සේ තුළ අපට ඇති බලාපොරොත්තු
- සදාකාලික ජීවනය ලැබීම පිණිස පුද්ගලයකුට තිබිය යුතු ආකල්ප සහ කළ යුතු ක්‍රියාවන්


* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350





Rs : 300




Rs : 300





Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200





Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE